සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.15

Learning Resource Centre
R
De Mazenod College
Kandana
57203

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
# ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
# Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name .................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I - කොටස

01. ඉතිහාසය ගැන අපට දැනුම ලබාගැනීමට උපයෝගී වන දේවල් හඳුන්වන්නේ මින් කුමන නමකින්ද?
 1. වංසකථා 2. මූලාශ්‍රය 3. ජනකතා 4. නටබුන්

02. හින්දු දින දර්ශනය අනුව කාලය මැනීමට යොදාගත් ක්‍රමයක් වන්නේ,
 1. බුද්ධ වර්ෂ යි. 2. ක්‍රිස්තු වර්ෂ යි. 3. ශත වර්ෂ යි. 4. හිජ්රි වර්ෂ යි

03. • අවුරුදු දශලක්ෂ පන්සිය හතලිස් දෙකකට පෙර ජීවත් වී ඇත.
 • ආහාර ගැනීමට මුඛයක් හා ඇස් පහක් පිහිටා තිබුණි.

 ඉහත වගන්තිවලට අනුව ජීවත් වූ සත්වයා හඳුන්වන්නේ කුමන නමකින්ද?
 1. ප්‍රොකායොට් බැක්ටීරියා 2. චිම්පන්සියා
 3. හැකරල්ලා 4. ඔපබීනියා

04. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා වන්නේ,
 1. නියැන්ඩතාලෙන්සිස් ය. 2. හෝමෝ ඉරෙක්ටස් ය.
 3. හෝමෝ හැබිලිස් ය. 4. ඔස්ට්‍රලෝපිතිකස් ය.

05. මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිත කිරීම පිළිබඳව සාක්ෂි හමු වූ රට කුමක්ද?
 1. ඊශ්‍රායලය 2. කැනඩාව 3. අප්‍රිකාව 4. ඉන්දියාව

06. මධ්‍ය ශිලා යුගයට අයත් විශේෂ ලක්ෂණයක් වන්නේ,
 1. දුනු ඊතල භාවිත කර දඩයම් කිරීම ය. 2. ධාන්‍ය වර්ග වගා කිරීම ය.
 3. ලෝහ වර්ග සොයා ගැනීම ය. 4. දඩයම හා තැන තැන ඇවිද ආහාර එකතු කිරීම ය.

07. නව ශිලා යුගයේදී මිනිසුන් නිපදවන ලදැයි සැලකෙන ඊශ්‍රායලයෙන් සොයාගත් දැකැත්ත තනා ඇත්තේ
 1. දැව වලිනි. 2. මැටි වලිනි. 3. ලෝහ වලිනි. 4. සත්ව ඇට කැබැල්ලකිනි.

08. ජලයේ ජීවය හට ගැනීමත් සමග පළමුවෙන්ම බිහිවන්නේ
 1. එක් සෛලයක් ඇති ජීවානුවක් ය. 2. විවිධ පණුවන් ය.
 3. මත්ස්‍යයින් ය. 4. සන්දිපාදිකයෝ ය.

09. කඳුකර ප්‍රදේශවල ගොවිතැන් කරමින් ජීවත් වූ අපේ රටේ පැරණිතම ජනතාව ධාන්‍ය වර්ග ආහාරයට ගත් බව සනාථ කරන ප්‍රධාන සාක්ෂියක් වන්නේ,
 1. මැටි වලන් හමුවීම යි. 2. වරිච්චි ගෙවල් තනා තිබීම යි.
 3. යකඩ මෙවලම් හමුවීම යි. 4. ඇඹරුම් ගල් හමුවීම යි.

10. ● වෘත්තයකට අංශක 360ක් තිබෙන බව
● පැයට මිනිත්තු 60ක් තිබෙන බව
ඉහත දැක්වෙන තොරතුරු මුලින්ම අපට ඉදිරිපත් කළේ කුමන ශිෂ්ටාචාරයක ගණිතඥයන් විසින්ද?
1. චීන 2. මෙසපොතේමියානු 3. ඉන්දුනිම්න 4. ඊජිප්තු

11. දුප්පත් හා පොහොසත් යන බෙදීම මුල්වරට ආරම්භ වන්නේ කුමන යුගයේ දී ද?
1. පුරාශිලා යුගය 2. මධ්‍යශිලා යුගය 3. නවශිලා යුගය 4. මහාහිම යුගය

12. චීන ශිෂ්ටාචාරය විසින් ලෝකයට උරුම කළ දායාදයක් වන්නේ මින් කුමක් ද?
1. රබර් බෝලය 2. කුන්‍ය අක්ෂර 3. මම්කරණය 4. මාලිමා යන්ත්‍රය

13. ඉතා ප්‍රසිද්ධියක් උසුලන පැරණි සිගුරාට් දේවාලය නිර්මාණය කරන ලදැයි සැලකෙන ශිෂ්ටාචාරය කුමක්ද?
1. චීන 2. මායා 3. ඊජිප්තු 4. මෙසපොතේමියානු

14. විජය කුමරු විසින් අග මෙහෙසි තනතුර සඳහා කුමාරිකාවක් ගෙන්වාගත් දේශය කුමක් ද?
1. චෝල 2. කාලිංග 3. පාණ්ඩ්‍ය 4. කේරළ

15. නගරයේ වාසය කරන මිනිසුන්ගේ කැළිකසල ඉවත්කිරීමට සේවකයින් පත් කළ රජතුමා කවුරුන්ද?
1. පණ්ඩුකාභය රජතුමා 2. දේවානම්පියතිස්ස රජතුමා
3. වසභ රජතුමා 4. ධාතුසේන රජතුමා

16. ථූපාරාම දාගැබ වර්තමානයේදි කුමන හැඩයකින් සකස් වී තිබේද?
1. ධාන්‍යාකාර 2. ඝණ්ඨාකාර 3. බුබ්බුලාකාර 4. ඝටාකාර

17. අනුරාධපුරයේ නගර සීමාව ලකුණු කරන ලද රජතුමාගේ නම කුමක්ද?
1. මුටසිව රජතුමා 2. දේවානම්පියතිස්ස රජතුමා
3. දුටුගැමුණු රජතුමා 4. සද්ධාතිස්ස රජතුමා

18. පසුකාලීනව අන්තර්ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත්වූ විහාරය වූයේ,
1. මහා විහාරය යි. 2. ජේතවනාරාමය යි.
3. ගෝකණ්ණ විහාරය යි. 4. අභයගිරි විහාරය යි.

19. ධාතුසේන රජතුමා සම්බන්ධව නිවැරදි වගන්තිය තෝරන්න.
1. එතුමාගේ පියා සද්ධාතිස්ස රජුය. 2. ලහබත්ගේ නමින් දාන ශාලාවක් කරවීම.
3. මහාපාළි දානශාලාව ප්‍රතිසංස්කරණය කිරීම. 4. ථූමාරාමයට වටදාගෙයක් ඉදිකිරීම.

20. කට පාඩමින් රැගෙන ආ බුද්ධ ධර්මය පොත්පත්වල ලිවීම සිදුවූයේ කුමන රජතුමාගේ කාලයේදීද?
1. දේවානම්පියතිස්ස 2. දුටුගැමුණු 3. වළගම්බා 4. වසභ


(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.


---

01. A හා B වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

1. රූපයෙන් දැක්වෙන මූර්තිය නම් කරන්න.
2. ඇය බිසව කරගත් රජතුමාගේ නම කුමක්ද?
3. මෙම රැජින විසින් පාලනය කරන ලද රට නම් කරන්න.
4. මෙම මූර්තිය කුමන ශිෂ්ටාචාරයකට අයත්වේද?



B

5. පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්දැයි සඳහන් කරන්න.
6. මෙය සොයාගත් ස්ථානය නම් කරන්න.
7. මේවා තනා ඇත්තේ කවුරුන් විසින්ද?
8. මෙය තැනීමට භාවිත කර ඇති ද්‍රව්‍ය කුමක්ද? (ලකුණු 2×8 =16)

02. i. 'ඔබේ පාසලේ ඉතිහාසය දැන ගැනීමට උපකාරි වූ මූලාශ්‍රය දෙකක් ලියන්න. (ලකුණු 2)
ii. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලට අයත්වන දේවල් හතරක් ලියන්න. (ලකුණු 4)
iii. ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

03. i. A - පළමු වරට ගොඩබිම පහළ වූ සත්ව වර්ගය නම් කරන්න.
B - මැමත් අලි ජීවත් වූ යුගය කුමක්දැයි නම් කරන්න. (ලකුණු 2)
ii. ලෝකය පුරා ව්‍යාප්ත වූ හෝමෝසාපියවරුන්ගේ දේහ ලක්ෂණ අනුව ඔවුන් හඳුන්වන නම් දෙකක් ලියන්න. (ලකුණු 4)
iii. පුරාශිලා යුගයේ මිනිසුන් ජීවත් වුයේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

04. i. චීන ශිෂ්ටාචාරයේ වැසියන් ලෝකයට දායාද කළ වටිනා දේවල් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. පහත සඳහන් දේවල් අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයකට දැයි අනුපිළිවෙළින් ලියන්න.
A - පිරමීඩ
B - මැටි පුවරුවල ලියන ලද කූන්‍ය අක්ෂර
C - සෙල්ලම් මැටි කරත්තය
D - ටුටන්කාමන් රජුගේ මුහුණ රනින් කළ අනුරුව (ලකුණු 4)
iii. මෙසපොතේමියානු සමාජයේ ලක්ෂණ පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 5)

05. i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ව්‍යාප්ත වී තිබූ ගංගා නිම්න දෙක නම් කරන්න. (ලකුණු 2)
ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වැසියන් කෘෂිකාර්මික කටයුතු හා සත්ත්ව පාලනය සිදුකළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)
iii. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ වැසියන් කෘෂිකාර්මික කටයුතු හා සත්ත්ව පාලනය සිදුකළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

06. i. පහත A හා B යටතේ සඳහන් වන රජවරු අයත්වන රාජවංසය කුමක්දැයි අනුපිළිවෙලින් ලියන්න.

A - වසභ රජතුමා

B - මහසෙන් රජතුමා

(ලකුණු 2)

ii. පහත සඳහන් වැව් කරවන ලද රජවරු කවුරුන්දැයි පහත වරහන තුළින් තෝරාගෙන A B C D අනුපිළිවෙලට ලියන්න.

A - අභය වැව

B - කලා වැව

C - හුරුළු වැව

D - මහවිලච්චිය

(පණ්ඩුකාභය රජතුමා, වසභ රජතුමා, මහසෙන් රජතුමා, ධාතුසේන රජතුමා)

(ලකුණු 4)

iii. වසභ රජතුමා ඉතා සාර්ථකව තම රාජ්‍ය පාලන කටයුතු සිදුකළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 5)

07. i. පහත සඳහන් වෙහෙර විහාර කරවූ රජවරු කවුරුන්දැයි A හා B අනුපිළිවෙලට ලියන්න.

A - ථූපාරාමය

B - අභයගිරිය

(ලකුණු 2)

ii. දුටුගැමුණු රජතුමාගේ සේනාවේ සිටි දක්ෂ සෙන්පතීන් සිව් දෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

iii. ධාතුසේන රජතුමාගේ වාරි කර්මාන්ත සේවය හා බුදු දහමට ඉටුකළ සේවය විස්තර කරන්න.

(ලකුණු 5)

06. i. පහත A හා B යටතේ සඳහන් වන රජවරු අයත්වන රාජවංසය කුමක්දැයි අනුපිළිවෙලින් ලියන්න.

A - වසභ රජතුමා

B - මහසෙන් රජතුමා

(ලකුණු 2)

ii. පහත සඳහන් වැව් කරවන ලද රජවරු කවුරුන්දැයි පහත වරහන තුළින් තෝරාගෙන A B C D අනුපිළිවෙලට ලියන්න.

A - අභය වැව

B - කලා වැව

C - හුරුළු වැව

D - මහවිලච්චිය

(ලකුණු 4)

(පණ්ඩුකාභය රජතුමා, වසභ රජතුමා, මහසෙන් රජතුමා, ධාතුසේන රජතුමා)

iii. වසභ රජතුමා ඉතා සාර්ථකව තම රාජ්‍ය පාලන කටයුතු සිදුකළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 5)

07. i. පහත සඳහන් වෙහෙර විහාර කරවූ රජවරු කවුරුන්දැයි A හා B අනුපිළිවෙලට ලියන්න.

A - ථූපාරාමය

B - අභයගිරිය

(ලකුණු 2)

ii. දුටුගැමුණු රජතුමාගේ සේනාවේ සිටි දක්ෂ සෙන්පතීන් සිව් දෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

iii. ධාතුසේන රජතුමාගේ වාරි කර්මාන්ත සේවය හා බුදු දහමට ඉටුකළ සේවය විස්තර කරන්න.

(ලකුණු 5)